# ලෝකය වූ දැනුම

දැනුම පිළිබඳ කිවයුතු වැදගත් කරුණක් නම් ඒ නිර්මාණය කෙරෙන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම පිළිබඳ අවිද්‍යාව නිසා බව ය. එසේ දැනුම නිර්මාණය කිරීම සාපේක්ෂ බව ද අපි කියා ඇත්තෙමු. එවිට දැනුම ඒ ඒ නිරීක්ෂකයාට සාපේක්ෂ වෙයි. එහෙත් ඉන් කියැවෙන්නේ ඒ ඒ නිරීක්ෂකයා තම තමන්ගෙන් ස්වායත්තව පවතින යමක් තම තමන්ට සාපේක්ෂව නිරීක්ෂණය කරන බව නො වෙයි. මෙය අපේ ඥාන විභාගයෙහි ප්‍රධානම කරුණක් ද වෙයි. එක් එක් අයගේ සාපේක්ෂ දැනුම ම නිර්මාණයකි. අපි අපෙන් ස්වායත්තව ඇති යමක් අපට සාපේක්ෂව නිරීක්ෂණය කරනවා නොව එසේ ස්වායත්තව යමක් නැතිව තිබිය දී සාපේක්ෂ යමක් නිර්මාණය කරමු. අපේ සාපේක්ෂ නිර්මාණාත්මක ප්‍රවාදයෙන් වෛද්‍ය විද්‍යාව, සමාජයීය විද්‍යාවන් ආදිය ද ඇතුළු දැනුම් පද්ධති සියල්ල එසේ නිර්මාණාත්මකව ඉදිරිපත් කෙරෙන බව පැවසෙයි.

අප නිර්මාණය කරන්නේ දැනුම ය. දැනුම යනු ලෝකය ද වෙයි. දැනුමෙන් තොර ලෝකයක් නැත. අප ද ඇතැම් අවස්ථාවල ලෝකය පිළිබඳ දැනුම යන ව්‍යවහාරය යොදාගන්නා නමුදු එය වැරදි ය. එය හුදෙක් සම්මුතියක් ලෙස යොදාගන්නා දෙයක් පමණකි. ලෝකය පිළිබඳ දැනුම යැයි කී විට ලෝකයක් පවතින බව ද අප ඒ ලෝකයෙහි දැනුම ලබාගන්නා බව ද ගම්‍ය වෙයි. එහෙත් ලෝකය යනු අන් කිසිවක් නොව අප නිර්මාණය කරන දැනුම වෙයි. දැනුම නිර්මාණය කරනු ලබන්නේ අප විසින් ය. ඒ දැනුමට අපි ලෝකය යැයි කියමු. එසේ නැතිව අපෙන් ස්වායත්තව පවතින ලෝකයක් නැත.

මේ ලෝකය යන්නට මා යනුවෙන් සඳහන් කෙරෙන්න ද අයත් වෙයි. එයට මගේ මනස ද අයත් වෙයි. මගේ මනස ලෝකයෙන් බාහිර ව ඇත්තක් නො වෙයි. එසේ වුවහොත් ලෝකය මගේ මනසෙන් බැහැරව පවතියි. ලෝකය යනු මනසෙහි නිර්මාණයක් වෙයි. මනස ද ලෝකයට ම අයත් බැවින් මනස ද මනසෙහි නිර්මාණයක් වෙයි. මනස මනසෙහි නිර්මාණයක් වන්නේ කෙසේ ද යන්න සිංහල බෞද්ධ මනස මැයෙන් දිවයින පුවත්පතට ලියූ ලිපියෙහි විස්තර කෙරී ඇත. මනස ද ඇතුළු ලෝකය යනු මනසෙහි නිර්මාණයක් සේ ගත්කල මනසින් තොරව, මනසින් පරිබාහිරව, මනසෙන් ස්වායත්තව ලෝකයක් නැත යන්න පැහැදිලි වෙයි.

අප බොහෝ අවස්ථාවල සඳහන්කර ඇති නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණය ගනිමු. බොහෝ දෙනා සිතන්නේ ලෝකයේ (විශ්වයේ) ඕනෑම අංශුවක් වෙනත් ඕනෑම අංශුවක් නිව්ටන් විද්වතා කියා ඇති ආකාරයෙන් ආකර්ෂණය කරන බව ය. විද්‍යාවේදී භික්ෂුන්වහන්සේ නමකට අනුව පුද්ගලයන් අතර වන ආකර්ෂණය ද එයම ය. එසේ නම් ඕනෑම පුද්ගලයකු ලිංග භේදයකින් තොරව වෙනත් ඕනෑම පුද්ගලයකුට ආකර්ෂණය විය යුතු ය. එමෙන් ම මව සහ දරුවා අතර වන ආකර්ෂණය සැමියා හා බිරිඳ අතර වන ආකර්ෂණයට ගුණාත්මක ව සමාන විය යුතු ය. එපමණක් නොව අංශු අතර ඇති නිව්ටෝනීය ආකර්ෂණය සමමිතික බැවින් මව දරුවකුට දක්වන සෙනෙහස දරුවකු මවට දක්වන සෙනෙහසින් ගුණාත්මක ව වෙනස් විය නො හැකි ය. මෙවැනි විහිළු සපයන විද්‍යාවේදී භික්ෂුන්වහන්සේගේ විද්‍යා දැනුම පමණක් නොව දහම් දැනුම ද පරීක්ෂණයකට ලක්කළ යුතු ය.

විද්‍යාවේදී භික්ෂුන්වහන්සේගේ ඒ විහිළු කතා කෙසේ වෙතත් අප ඉහත සඳහන්කර ඇති දෙයට උදාහරණයක් ලෙස නිව්ටෝනීය ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ඉදිරිපත් කළ හැකි ය. අප කිහිප වතාවක් ම කියා ඇති පරිදි ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය නිව්ටන් විද්වතාගේ නිර්මාණයකි. ඔහුට පෙර භාරතයේ විසූ විද්‍යාඥයන් ගුරුත්වාකර්ෂණය ගැන ප්‍රකාශකර තිබුණ ද, ඒ සඳහා ඔහු ඉදිරිපත්කළ සූත්‍රය ඉදිරිපත්නොකරන්නට ඇත. ඒ කුමක් වුවත් කවුරුන් පළමුව ගුරුත්වාකර්ෂණය ලොවට ප්‍රකාශකළත් අපේ ප්‍රශ්නය වනුයේ ගුරුත්වාකර්ෂණය යනුවෙන් ප්‍රපංචයක් ඇත් ද යන්න ය. එනම් ගුරුත්වාකර්ෂණය ලෝකයේ පවතින්නක් ද, ලෝකයේ ඇතැයි කියන අංශුවල හා වස්තුවල ගුණයක් ද යන්න ය.

ලෝකයේ එවැනි ගුණයක් නැති බවට ඇති හොඳම සාක්ෂිය අයින්ස්ටයිනීය ප්‍රවාදයයි. එයට අනුව පොල්ගෙඩි පොළොවට වැටෙන්නේ පෙළොවෙහි ආකර්ෂණයක් නිසා නොව පොළොව අසල අවකාශ කාලය වක් වී ඇති හෙයිනි.

© Prof. Nalin De Silva

අවකාශ කාලයේ වක්‍රතාව විසින් අංශුවල චලිතය තීරණය කෙරෙයි. පොල්ගෙඩි පොළොවට වැටීම නිව්ටන් හා අයින්ස්ටයින් පඩිවරු දෙයාකාරයකට විස්තරකරන්නේ කෙසේ ද? ඉන් එකක් හෝ ලෝකයෙහි ඊනියා ගුණයක් වී නම් අනෙකට කිසිම පැවැත්මක් තිබිය නො හැකි ය.

ඒ ප්‍රවාද දෙකෙන් ම සිදුවන්නේ පොල්ගෙඩි පොළොවට වැටෙන්නේ ඇයි ද යන්නට කතන්දර සැපයීම පමණ ය. ඒ එක් ප්‍රවාදයකින් හෝ ලෝකයේ ගුණයක් නො කියැවෙයි. එා ප්‍රවාද දෙකම නිර්මාණ පමණ ය. නිව්ටන් විද්වතා විසින් ගුරුත්වාකර්ෂණය පිළිබඳ දැනුමක් සොයාගනු ලැබ නැත. ඔහු ගුරත්වාකර්ෂණය නිර්මාණය කර ඉන් වැඩගන්නා අයුරු පැහැදිලි කෙළේ ය. ඔහු නිර්මාණය කෙළේ ගුරුත්වාකර්ෂණය පිළිබඳ දැනුම ය. ඒ දැනුම ඊනියා ගුරුත්වාකර්ෂණය බවට පත්වී ඇත. ගුරුත්වාකර්ෂණය යනු අදාළ දැනුම මිස අන් කිසිවක් නො වෙයි. ලෝකය යනු දැනුම මිස අන් කිසිවක් නො වෙයි.

ගුරුත්වාකර්ෂණය සම්බන්ධයෙන් පමණක් නොව පොල් ගෙඩිය සම්බන්ධයෙන් ද කිවහැක්කේ එයම ය. පොල් ගෙඩිය යනු පොල් ගෙඩියෙහි ඇතැයි කියන ගුණ මිස එයට අඩු හෝ වැඩි හෝ දෙයක් නො වෙයි. ලෝකය යනු දැනුම ය. දැනුම යනු නිර්මාණය කෙරෙන්නකි. පොල් ගෙඩියේ තද බව, පැහැය, හැඩය ආදිය අපේ පංචෙන්ද්‍රිය හා මනෙන්ද්‍රිය (බටහිරයන්ට කෙසේ වෙතත් අපට මනස ද ඉන්ද්‍රියයකි,) එකතු වී නිර්මාණය කෙරෙන ගුණ ය. අප පොල් ගෙඩිය යනුවෙන් හඳුන්වන්නේ මේ සියළු ගුණ එකතුකරමින් මනස විසින් නිර්මාණය කෙරෙන්නකි. පොල් ගෙඩියේ පැහැය කොළ හෝ දුඹුරු යැයි කියන විට එහි දී මනස ද ඇස ද එකතු වෙයි. එහෙත් පොල් ගෙඩිය යනුවෙන් වස්තුවක් නිර්මාණය කිරීමේ දී එසේ මනසට එකතුවන ඉන්ද්‍රියක් නැත. පොල් ගෙඩිය යන වස්තුව පොල් ගෙඩිය ලෙස හඳුනාගන්නා (එනම් ගෙඩිය නිර්මාණය කරන) ඉන්ද්‍රියක් නැත. පැහැය නිර්මාණයට, එනම් පැහැය යනුවෙන් යමක් හඳුනාගැනීමට, මනස සමග ඇස ද යොදාගැනෙන නමුත් වස්තුව නිර්මාණය කිරීමේ දී මනසට හවුල්වන වෙනත් ඉන්ද්‍රියක් නැත.

අපට වෙනත් ඉන්ද්‍රිය පද්ධතියක් තිබිණි නම් අප නිර්මාණය කරන ලෝකය වෙනත් ලෝකයක් වනු ඇත. බල්ලන්ගේ ලෝකය මිනිසුන්ගේ ලෝකයෙන් වෙනස්වන්නේ බල්ලන්ගේ ඉන්ද්‍රිය පද්ධතිය හා මනස මිනිසුන්ගේ ඉන්ද්‍රිය පද්ධතියෙන් හා මනසින් වෙනස්වීම ද හේතුවක් කරගනිමිනි. මේ පිළිබඳ දිගින් දිගට ලියා ඇති නමුත් විවිධ පුද්ගලයෝ එයට තම තමන්ගේ අසංගත අර්ථකථන දෙති. ඉන්ද්‍රිය පද්ධතියට හා මනසට හැර දැනුම නිර්මාණයෙහි දී බලපාන අනෙක් වැදගත් සාධකය වන්නේ සංස්කෘතිය ය. ඒ සංස්කෘතිය හා බැඳුණු චින්තනය ය. ඒ ඒ මිනිසාගේ මනස හා ඉන්ද්‍රිය පද්ධතිය වෙනස් බැවින් ඒ ඒ මිනිසා නිර්මාණය කරන ලෝකය අනන්‍ය වෙයි. එහෙත් යම් සංස්කෘතියක ජීවත්වන සියළු දෙනාට ඒ සංස්කෘතියෙන් යම් පොදු දැනුමක් ලබා දීමට කටයුතු කෙරෙයි. එහෙත් ඒ පොදු දැනුමෙහි ද විශේෂිත තිබෙනු දැකිය හැකි ය. සංස්කෘතියක ඇත්තේ එකම දැනුමක් නොවීමට ප්‍රධාන හේතුවක් වන්නේ නැවත වරක් කියන්නේ නම් ඒ ඒ පුද්ගලයන්ගේ වෙනස්කම් ය. ඇතැමුන් භෞතිකවාදීන් වන්නේත් තවත් අයකු විඥානවාදීන් වනානේත් අප විඥානවාදී හෝ භෞතිකවාදී හෝ නොවනානේත් මේ වෙනස්කම් නිසා ය. අපේ සාංසාරික පුරුදු හේතුකොටගෙන අපේ මනස් වෙනස් බව අමුතුවෙන් කිවයුතු නො වෙයි.

ජාතියක් සතු පොදු චින්තනයක් තිබුණ ද ඒ ජාතියට අයත් ඇතැමුන් චින්තනය අතින් බහුතරයෙන් වෙනස්විය හැකි ය. එයට ප්‍රධාන හේතුවක් වන්නේ අපට ලැබෙන අධ්‍යාපනය ය. අපේ අධ්‍යාපනය, යුරෝපය හා ඇමරිකාව දෙස බලමින් සකස් කෙරෙන්නකි. එහි අපේ චින්තනයක් නැත. උගන්වන දැයෙහි පමණක් නොව පාසල් නිවාඩු කාලවල ද මේ අනුකාරකත්වය දැකිය හැකි ය. පාසල් වාර සකස් කිරීමේ දී මෙරට වැසි කාල, ග්‍රීෂ්ම කාල ආදිය සැලකිල්ලට ගෙන නැත. පාඨමාලා ගැන කියනුම කවරේ ද? කෙසේ හෝ මේ අනුකාරක අධ්‍යාපනය හේතුකොටගෙන බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට අනුව හැඩගැස්සවෙන යම් පිරිසක් මෙරට වෙති. ඔවුහු එලොවට ද මෙලොවට ද අයත් නො වෙති. එහෙත් මතවාදී ආධිපත්‍යය ඇත්තේ ඔවුන්ට ය. එයට හේතුව අද මුළු ලෝකයෙහි ම බටහිරයන්ට ඇති ආධිපත්‍යය ය.

මේ පිරිස එලොවට ද මෙලොවට ද අයත් නොවන්නේ ඔවුන් මෙරට සංස්කෘතියෙන් හා චින්තනයෙන් උදුරනු ලැබීමත්, ඔවුන්ට බටහිරයන්ගේ සංස්කෘතියෙහි හා චින්තනයෙහි දෙපා රුවා ගැනීමට නොහැකිවීමත් නිසා ය. ඔවුන්ට උපරිම

© Prof. Nalin De Silva

වශයෙන් කළ හැක්කේ බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය කට ගා ගැනීම පමණකි. යම් පිරිසක් ඇතැම් කරුණුවලින් බටහිර සංස්කෘතියෙහි ද වෙනත් කරුණුවලින් මෙරට සංස්කෘතියෙහි ද සිටීමට උත්සාහ කරති. ඒ අයගේ කාර්යයන්හි පරස්පර දැකීමට හැකිවීම අනපේක්ෂිත වුවක් නො වෙයි. මාර්ටින් වික්‍රමසිංහ මහතා මේ සම්බන්ධයෙන් හොඳම උදාහරණය වෙයි. ඒ මහතා බොහෝ අංගවලින්  බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පිළිගත්තේ ය. බටහිර නවකතාව හා කෙටිකතාව ඊනියා සිංහල පාඨකයාට හඳුන්වාදුන්නේ ඔහු ය. ඔහු ඩාවිනීය පරිණාමවාදය පමණක් නොව බටහිර මානව විද්‍යාවද පිළිගත්තේ ය. ඔහු තමන් නොදත් සාපේක්ෂතාවාදය ගැන ලිවී ය. ඔහු බටහිර විද්‍යාවෙද ඇතැම් කරුණු බුදු දහම සමග සංසන්දනයකිරීමට උත්සාහගත්තේ ය. එහෙත් ඒ අතර ඔහු අපේ කමක් ගැන කතා කෙළේ ය. පැරණි සිංහල සංස්කෘතියේ  අදීනත්වය ගැන ලිවී ය. භාරතීය සංස්කෘතියෙන් සිංහල සංස්කෘතිය වෙනස්වූ ආකාරය ඔහු පෙන්වා දුන්නේ ය. මේ ද්විත්ව චරිතය හේතුවෙන් මාර්ටින් වික්‍රමසිංහ මහතා බටහිර අනුකාරකයන්ගෙන් මෙන් ම ඇතැම් ජාතිකවාදීන්ගෙන් ද (nationalists) ගෞරවයට පාත්‍ර වෙයි. අනුකාරකයන්ට බැණ වැදුන ද, ඔහු තමන් විශේෂ දක්ෂකම් දැක් වූ නවකතාකරණයෙහි හා කෙටිකතාකරණයෙහි ලා අනුකාරකයෙක් විය. ඔහු අවශෝෂණය යනු කුමක්දැයි දැන නො සිටියේ ය. එසේ දැනසිටියේ නම් සමහරවිට ඔහුට බටහිර කෙටිකතාව හා නවකතාව සිංහල සංස්කෘතියට අවශෝෂණය කිරීමට හැකි වීමට තිබුණි.

පුද්ගලයන් එසේ ද්විත්ව චරිත ගතකල ද ඔවුන්ගේ ඒ ඒ දැනුම් වෙනස් චින්තන මත පදනම් වුව ද විවිධ ක්ෂෙත්‍රවල යම් චින්තනයක් මත පදනම් වී නිර්මාණය කෙරෙන දුනුම් අතර සම්බන්ධයක් වෙයි. අපේ ප්‍රවාද විවිධ ක්ෂෙත්‍රවල නිර්මාණය  කෙරෙන්නේ මේ පොදු බව පදනම් කරගනිමිනි. පුද්ගලයන්ගේ විවිධ දැනුම් විවිධ චින්තන මත පදනම් වී නිර්මාණය වූ දැනුම් විය හැකි වුව ද එක් චින්තනයක් මත පදනම් වී විවිධ ක්ෂෙතවල නිර්මාණය කෙරෙන දැනුම් අතර පොදු බවක් වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva